00904

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2023/2024
EPU6234 - ප්‍රාථමික පන්තිකාමර කළමනාකරණය
කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2025.06.29 වේලාව - ප.ව.1.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසින් තෝරා ගත් ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සුදුසු නිර්වචනයක් යොදා ගනිමින් කළමනාකරණය යන යෙදුම අර්ථ දක්වන්න.

02. "ප්‍රාථමික පාසල් ගුරුවරුන්ට සැබෑ පන්ති කාමර පරිසරයක් තුළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන විට පන්ති කාමර කළමනාකරණය ඉතා වැදගත් වේ." ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? කරුණු හතරක් (04) දක්වමින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

03. ප්‍රාථමික පාසලක සෙල්ලම් මිදුලේ ක්‍රියාකාරකම් සංවිධානය කරන විට සැලකිලිමත් විය යුතු කරුණු හතරක් (04) ලැයිස්තුගත කර ඉන් එකක් (01) කෙටියෙන් විස්තර කරන්න.

04. පාසලක පරිපාලන නායකයා ලෙස ප්‍රාථමික පාසල් විදුහල්පතිගේ ප්‍රධාන වගකීම් පහක් (05) කෙටියෙන් සාකච්ඡා කරන්න.

05. ප්‍රාථමික පාසල් සංදර්භය තුළ සංවිධානය කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් හතරක් (04) විස්තර කරන්න.

06. ප්‍රාථමික අධ්‍යාපන ගුරුඋපදේශකවරු අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා සහාය වන්නේ කෙසේද? කරුණු පහක් (05) දක්වමින් කෙටියෙන් සාකච්ඡා කරන්න.

07. ප්‍රාථමික පන්තිකාමර කළමනාකරණයෙන් ලබාගත හැකි ප්‍රතිලාභ පහක් (05) ලැයිස්තුගත කරන්න.

08. ප්‍රාථමික පන්ති කාමරයක ක්‍රියාකාරකම් සැලසුම් කිරීම යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

ලකුණු 05 X 08 =40

## 2 කොටස

09. I. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වල ප්‍රධාන අංග විස්තර කරන්න. (ලකුණු 10 )

II. 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් හඳුන්වාදෙන ලද ප්‍රධාන ඉගැන්වීමේ ක්‍රම තුන (03) රූප සටහනක් භාවිත කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

10. I. රූප සටහන් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ කලාප අධ්‍යාපන කාර්යාලයක සංවිධාන ව්‍යුහය විස්තර කරන්න. (ලකුණු 10 )

II. ශ්‍රී ලංකාවේ කලාප අධ්‍යාපන කාර්යාලවල ප්‍රධාන භූමිකාවන් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10 )

11. I. ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස වර්තමානයේ රජය විසින් ලබා දෙන පහසුකම් පිළිබඳව ඔබ සෑහීමකට පත් වන්නේද? උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 )

II. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන පද්ධතිය තුළ ප්‍රාථමික පාසල් ගුරුවරුන් මුහුණ දෙන ගැටලු පැහැදිලි කරන්න. (ලකුණු 10 )

12. I. කළමනාකරණ ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08 )

II. ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස ඔබ ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන අරමුණු ඉටුකර ගත හැකි අයුරින් පාරිසරික සම්පත් යොදාගන්නේ කෙසේද? (ලකුණු 12 )

13. පහත සඳහන් ඒවායින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. ප්‍රාථමික අධ්‍යාපන අංශය තුළ සම්පත් කළමනාකරණය කිරීමේ ගැටලු.

II. පන්ති කාමර අධීක්ෂණ ක්‍රියාවලිය.

III. නියෝජ්‍ය විදුහල්පතිගේ (අධ්‍යාපන සංවර්ධන) වගකීම්.

IV. පාසල් සංවර්ධන මණ්ඩලයේ වගකීම්. (10 X 02= ලකුණු 20)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*



129